**ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017**

**-----------------------------------------------------------------------**

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහනේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර 2010 පෙබරවාරි 23 දින එළඹි අංක 797 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

**---------------------------------------------------------------------------------------------**

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහනේ මූල්‍ය ගිවිසුම අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැඩසටහනේ ප්‍රධාන නියෝජිතායතනය වූ අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත වගකීමද දැරිය යුතු විය. කෙසේ වුවද, 2013 ජනවාරි මාසයේ දී කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මධ්‍යකාලීන පසු සමාලෝචන දූත කණ්ඩායමේ නිර්දේශ අනුව, 2013 මැයි මාසයේ සිට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහනේ ප්‍රධාන නියෝජිතායතනය වූ අතර "දිවිනැගුම වැඩසටහන" සමඟ සම්බන්ධ වීම මගින් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත වගකීම දැරිය යුතු විය. 2015 අප්‍රේල් 30 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතට වැඩසටහනේ කාර්යයන් මාරුකර තිබුණි. වර්තමානයේ මෙම වැඩසටහනේ කාර්යයන් අතිගරු ජනාධිපතිතුමාගේ ලේකම් වෙත මාරු කර තිබුණි. වැඩසටහනේ අරමුණු වූයේ කුඩා ඉඩම් හිමි ගොවීන් හා ඉඩම් නොමැති ගොවීන් සඳහා සහාය වීමට විශේෂයෙන් තරුණයන්ට, (i) ගොවිපොළේදී අයකරන මිල සහ ගොවිපොළ එළදාව සහ පෙරසැරි ගොවිපොළ නිෂ්පාදන සඳහා අගය එකතු කරන වෙළඳපොළ දාමය සංවර්ධනය හා සම්බන්ධක සංරචකයෙහි සහභාගීත්වය මගින් ඔවුන්ගේ ආදායම වැඩිකිරීම. (ii) ඉඩම් නොමැති අයට සහ තරුණයන්ට වැඩිදියුණු කළ හා ඉහළ නංවන ලද රැකියා අවස්ථාවන් ලබාදීම සඳහා මූල්‍ය ප්‍රතිපාදනයන් හා පුහුණුව ලබාදීම විය.

මූල්‍ය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,309.52 කට සමාන එජඩො මිලියන 32.9 ක් වූ අතර ඉන් රු.මිලියන 3,268.75 කට සමාන එජඩො මිලියන 25 ක් මූල්‍යයනය කිරීමට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල එකඟ වී තිබුණි. ඉතිරි අරමුදල් සඳහා ශ්‍රී ලංකා රජය, ප්‍රවර්ධක සමාගම්, නිෂ්පාදකවරුන්, ප්‍රජා මූල සංවිධාන හා සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් දායක වීම අපේක්ෂා කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2011 පෙබරවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2016 මාර්තු වන විට නිමකිරීමට නියමිත විය. සම්පත් නැවත වෙන් කිරීමටත් වැඩසටහන අවසන් කිරීමේ දිනය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරීමටත් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල එකඟ වී තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට හා ව්‍යාපෘති විගණනය වෙනුවෙන් වූ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර

ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1 මතය**
**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූරණයන් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**
**-------------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**
**-----------------------**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරනලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| කෘසජාඅ | 25.00 | 3,268.75 | 1,235.00 | 7.05 | 1,077.60 | 19.33 | 2,839.91 |
| පුද්ගලික සමාගම් | 5.25 | 686.44 | - | - | 301.31 | - | 406.01 |
| ප්‍රජා මූල සංවිධාන | 0.76 | 99.37 | - | - | - | - | - |
| සහභාගීත්ව මූල්‍ය ආයතන | 0.39 | 50.99 | - | -- | - | - | - |
| බාහිර වැවිලිකරුවන් | 0.57 | 74.53 | - | - | - | - | - |
| ශ්‍රී ලං ර | 0.99 | 129.44 | 50.00 | - | 44.98 | - | 65.93 |
| එකතුව | 32.96 | 4,309.52 | 1,285 | 7.05 | 1,423.89 | 19.33 | 3,311.85 |

ඉහත තොරතුරු අනුව, ණය නියෝජිතායතනයේ රු.මිලියන 3,268.75 කට සමාන එජඩො මිලියන 25 ක මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 2,839.91 කට සමාන එජඩො මිලියන 19.33 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණි. තවද, මූල්‍ය ගිවිසුම අනුව ප්‍රවර්ධක සමාගම් විසින් රු.මිලියන 684.44 ක් ආයෝජනය කල යුතුව තිබුණද ඔවුන්ගේ දායකත්වය රු.මිලියන 406.01 ක පමණක් විය.

### 3.2 භෞතික ප්‍රගතිය

අලෙවිකරණ දාමය සංවර්ධනය හා සම්බන්ධක මෙහෙයවන පුද්ගලික අංශය හා ප්‍රජා මූල සංවිධාන සංරචකයන් යටතේ වැඩසටහනේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හා තරුණයන් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය හා පුහුණුව ලබාදීම ආදිය අපේක්ෂා කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩසටහන විසින් ප්‍රවර්ධක සමාගම් සමඟ එළැඹි ගිවිසුම අනුව කිරි නිෂ්පාදන ව්‍යාපාර ප්‍රවර්ධක සමාගම් 02 ක් හා කෘෂි කාර්මික ව්‍යාපාරවල නියුතු ප්‍රවර්ධක සමාගම් 04 ක් විසින් වගාකරුවන් වෙනුවෙන් රක්ෂණ ආවරණ ලබා ගෙන නොතිබුණි.

(ආ) වැඩසටහන සහ ප්‍රවර්ධක සමාගම් අතර ඇතුලත් වූ ගිවිසුම අනුව මුහුදු පැලෑටි වගාකරුවන් 878 දෙනෙකුට රු.මිලියන 34.27 ක ඇස්තමේන්තු පිරිවැයකට මොනෝ ලයින්ස් හා රාෆ්ට්ස් (mono lines and rafts) බෙදාහැරිය යුතුව තිබුණද, ගිවිසුම අවසන වන 2017 දෙසැම්බර් 21 දින රු.මිලියන 26 ක පිරිවැයකට වගාකරුවන් 667 කට පමණක් මොනෝ ලයින්ස් හා රාෆ්ට්ස් බෙදාහැර තිබුණි. පැහැදිලි කිරීම්වලට අනුව වැඩසටහන මෙහෙයවන ලද බොහෝ ප්‍රදේශවල පැවති අහිතකර කාලගුණ තත්ත්වය හේතුවෙන් ඉලක්ක ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) විගණනය සඳහා ලද තොරතුරු අනුව, කිරි නිෂ්පාදනයේ නියුතු ගොවීන්ගේ සමාජ හා තාක්ෂණික ගැටළු හඳුනාගෙන පිළියම් යෙදීම සඳහා සමාජ සජීවීකරුවන් 20 දෙනෙකු වැඩසටහන විසින් යොදවා තිබුණි.

කෙසේ වුවද, විගණකවරුන් විසින් මාතලේ යටවත්ත සහ රත්තොට ප්‍රදේශවල කිරි ගොවීන්ගේ පරිශ්‍රය කරන ලද ස්ථානීය පරීක්ෂාවලදී ජල සැපයුම් පද්ධතියක් නොමැතිවීම නිසා ගොවීන් විසින් පවත්වාගෙන යනු ලබන ගව මඩුවල තත්ත්වය යහපත් මට්ටමක නොතිබුණු බව අනාවරණය විය. තවද, ඉදිකරන ලද ගවමඩුවලට විදුලි සැපයුම් නොමැති වීම නිසා මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත, පල්ලෙපොල, රත්තොට සහ නාඋල ප්‍රදේශවල ගොවීන් අදහස් කල අරමුණු සඳහා කිරි ලබාගැනීමේ යන්ත්‍ර භාවිතා නොකරන බව එම ස්ථාන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) තවද, ගර්කින් වගාවේ යෙදෙන ප්‍රවර්ධක සමාගම් විසින් වගාකරුවන් විසින් විකුණනු ලබන ගර්කින් කිලෝග්‍රෑම් 01 කින් රු.එකක් බැගින් දායක කර වගාකරුවන් සඳහා සුභසාධක අරමුදලක් ගොඩනැගීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ඉ) ප්‍රවර්ධක සමාගම් ගොවීන්ගේ මුළු නිෂ්පාදනයම මිලදී ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල ලූණු පැලැටි හා කාබනික බඩඉරිඟු වගා ව්‍යාපාර කරනු ලබන ප්‍රවර්ධක සමාගම් 02 විසින් පිළිවෙලින් දඹුල්ල හා අනුරාධපුර ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) ප්‍රවර්ධක සමාගම් විසින් මූලික අදියරේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික බඩඉරිඟු වගාවේ නිරත ගොවීන් තෝරා ගැනීමේදී ඔවුන්ගේ මූල්‍ය හා භෞතික හැකියාව සැලකිල්ලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොවීන්ට සම්පූර්ණ ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වන පරිදි ණය ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) අනුරාධපුර බලයලත් විශේෂඥ බැංකු ශාඛා 02 ක් අනෙකුත් ණය ක්‍රම යටතේ ලබාගත් ණය මුදල්වල හිඟ ශේෂයන් වැඩ සටහන විසින් ප්‍රදානය කල උප ණය මුදල්වලින් අයකර ගැනීමට පියවර ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. තවද, වැඩ සටහන විසින් කාබනික බඩ ඉරිගු වගාව කිරීම සඳහා ලබාදුන් මූල්‍ය සම්පත් අදහස් කරගත් අරමුණු සඳහා භාවිතා කර නොමැති බව පෙනී යයි.

(ඌ) කිතුල් නිෂ්පාදිතවල අඩු නිෂ්පාදනය නිසා රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රදේශයේ කිතුල් නිෂ්පාදිත නිෂ්පාදකයින් වැඩ සටහන විසින් ලබාදුන් පැණි නිෂ්පාදිත ප්‍රයෝජනය සඳහා වන මල නොබැඳෙන බඳුන් හා පැණි ගබඩා කිරීම සඳහා ලබාදුන් මල නොබැඳෙන භාජන ආදී උපකරණ භාවිතා කර නොතිබුණි.

(එ) පරීක්ෂණ පදනමක් මත යාපනය, කාත්තන්කුඩි හා කල්මුනේ ප්‍රදේශවල කරන ලද භෞතික ස්ථාන පරීක්ෂාවේදී ණය ලබාගත් පුද්ගලයින් 05 දෙනෙකු ක්ෂුද්‍ර මූල්‍යායනය ප්‍රයෝජනය සඳහා බැංකුවලට ඉදිරිපත් කර තිබූ අයදුම්පත් හා ඇස්තමේන්තුවල අදහස් කර තිබූ අරමුණුවලට පරිබාහිර කරුණු සඳහා අරමුදල් යොදවා තිබූ බව නිරීක්ෂණය විය.